12th Academic Sessions
University of Ruhuna, Matara, Sri Lanka ISSN 2362-0412

# සිංහල ගීත රචකයන් ජාතක කතා දෙස හෙළූ දෘෂ්ටිය පිළිබඳ විමසුමක්

ඩබ්ලිව්.ඒ.ඩී. තමාරා කුමාරි

*සිංහල අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

*thamarakumari87@gmail.com*

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලාංකේය ගීත සාහිත්‍යයේ වැදගත් ප්‍රවණතාවක් ලෙස ජාතක කතා පදනම් කර ගත් ගීත රචනා පෙන්වා දිය හැකි ය. ජාතක කතා තරම් මනුෂ්‍ය ජීවිතය පිළිබඳ විවරණය වූ තවත් සාහිත්‍යාංගයක් නොමැති තරම් ය. සමකාලීන සමාජයේ සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික පසුබිම පිළිබිඹු කරන වැදගත් සාහිත්‍යාංගයක් ලෙස ජාතක කතා සැලකිය හැකි ය. "පෙදෙන් බුදු සිරිත" නම් වූ සියබස්ලකර නියමය අනුව යමින් රචිත කාව්‍ය සඳහා ද බුදු සිරිතටත් වඩා බෝසත් සිරිත වස්තුවිෂය වූ බව පුරාතන පද්‍ය සාහිත්‍ය දෙස විමසීමේදී පැහැදිලි වේ. පුරාතන පද්‍ය සාහිත්‍යයේ පමණක් නොව, ගද්‍ය සාහිත්‍යයේ ද සුවිශේෂී වස්තු විෂයක් වූ ජාතක කතා ගීත සාහිත්‍යයේ ද බොහෝ ගීත රචනා සඳහා වස්තු විෂය වී තිබේ. ගීත සාහිත්‍යය සඳහා ගීත රචකයන් ජාතක කතා තෝරා ගැනීමේදී විවිධ දෘෂ්ටි ඔස්සේ ගීත රචනා කර ඇත. මෙම පර්යේෂණය මඟින් සිදු වූයේ ගීත සඳහා පාදක වූ ජාතක කතාවන්හි ජාතක කතාවල දෘෂ්ටිය හා එම ජාතක කතා දෙස ගීත රචකයන් හෙළූ දෘෂ්ටිය විමර්ශනය කිරීම ය. එහි දී එක් එක් ගීත රචකයන් ජාතක කතාවේ විවිධ චරිත ඔස්සේ යමින් එම චරිත සිතන ආකාරය ගීත රචකයාගේ දෘෂ්ටියෙන් ඉදිරිපත් කර තිබේ. එහි දී ගීත රචකයාගේ මනෝභාව ජාතක කතාවේ චරිතයන්හි මනෝභාව ලෙස නිරූපණය වී තිබීම සුවිශේෂත්වයකි. එක ම ජාතක කතාව දෙස එක ම ගීත රචකයා මෙන් ම, විවිධ ගීත රචකයන් හෙළූ දෘෂ්ටි එකිනෙකට වෙනස් ය. අප දන්නා සම්මත කතා පුවත හුදෙක් ගීතය මඟින් ඉදිරිපත් නොකොට, එක් එක් චරිත ඔස්සේ ඔවුන්ගේ මනෝභාව ගීත මඟින් ඉදිරිපත් කිරීම කැපී පෙනෙන ලක්ෂණයකි. පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය සහ අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය (Content Analysis) භාවිත කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදි. ජාතක කතාකරුවාගේ දෘෂ්ටියත්, එකී ජාතක කතා දෙස ගීත රචකයන් හෙළූ දෘෂ්ටියත්, ජාතක කතාවේ චරිත එකී ජාතක කතාව දෙස හෙළූ දෘෂ්ටියත් සංසංදනාත්මක ව හඳුනා ගැනීමට මෙමඟින් හැකි විය. එහි දී ජාතක කතාව හා ගීතය අතර සමානතා, විෂමතා හා පරස්පරතා ඇති බවත්, ජාතක කතා වර්තමාන සමාජය හා සමඟ ගළපා ගීත රචනා කර ඇති බවත් නිගමනය කළ හැකි විය.

***ප්‍රමුඛ පද:*** *ජාතක කතා, සිංහල ගීත රචනා, ගීත රචකයන් දෘෂ්ටිය, මනෝභාව*